

# නීති විරෝධි ලෙස කොරියානු රටෙහි රැඳී සිටින සංක්‍රමණිකයෙනි, ***ස්වේච්ඡා පිටත්වීමේ වැඩසටහනින් ප්‍රයෝජනයක් ලබා ගන්න***

අපගේ යාවත්කාලීන කළ ස්වේච්ඡාවෙන් පිටත්වීමේ වැඩසටහන තුළින් ඇතුළුවීමේ තහනමකින් හෝ දඩ මුදලකින් තොරව කොරියාවේ පිටත්වීමේ අවස්ථාවක් කොන්දේසි විරහිතව ඔබ වෙත පිරිනමනු ලබයි.

1. **ඔබ නීති විරෝධි සංක්‍රමණිකයෙක් නම් , 2019 දෙසැම්බර් 11 සහ 2020 ජුනි 30 අතර ස්වේච්ඡා පිටත්වීමේ අවස්ථාවක් සඳහා අයදුම් කරන්න.**

- **ඔබ යා යුතු වන්නේ කොතැනටද?**

ඔබ රැඳී සිටින පදිංචි ප්‍රදේශය තුළ ඇති ආගමන කාර්යාලයට යන්න

- **ඔබ රැගෙන යා යුතු ලිපි ලේඛන මොනවාද?**

ඔබගේ ගමන් බලපත්‍රය, ස්වේච්ඡාවෙන් පිටත්වීම පිළිබඳ ප්‍රකාශය සහ බෝඩින් පාස් එක

- **පිටත්වීමට පෙර ඔබ ලබා ගත යුතු දේ මොනවාද?**

ස්වේච්ඡාවෙන් පිටත්වීම සහතික කළ ලේඛනයක් ඔබට ලැබෙනු ඇත. කරුණාකර මෙම ලේඛනය පරිස්සම් කර ගන්න.

- **ඔබට හිමිවන ප්‍රතිලාභ මොනවාද?**

දඩ මුදලෙන් නිදහස් කෙරෙනු ඇත. ඔබ අසාදු ලේඛනයට ඇතුළත් නොකෙරෙනු ඇත.අවශ්‍ය නම් පසුව ඔබට E-9, D-2, D-4, D-8 වර්ගයේ වීසා බලපත්‍ර සඳහා අයදුම් කළ හැක.

- **කොරියාවට නැවත ඇතුළුවීම සඳහා කොරියානු වීසා සඳහා අයදුම් කරන්නේ කෙසේද? කවදාද?**

ඔබ කොරියාවෙන් *ස්වේච්ඡාවෙන් පිටත්වූ දිනයට අනුව පැමිණි දින සිට මාස 3 - 6 ක් ඇතුළත ඔබගේ මවු* රටේදී C-3 වීසා බලපත්‍රය (**එක් ගමන් වාරයක් සඳහා ලබා දෙන වීසා බලපත්‍රය,** උපරිම දින 30ක් නැවතීම සඳහා) සඳහා අයදුම් කළ හැකිය.

ඒ සඳහා ඔබ විසින් පහත සඳහන් ලේඛන ඔබගේ රටේ තිබෙන කොරියානු තානාපති කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය.

අ) ස්වේච්ඡාවෙන් පිටත්වීම සහතික කළ ලේඛනයක්
ආ) ඔබගේ රටේ නීතිය ක්‍රියාත්මක කරන ආයතනයකින් නිකුත් කළ අපරාධ වාර්තාව
ඇ) ක්ෂයරෝග පරීක්ෂණ වාර්තාව

මෙම වීසා බලපත්‍රය සඳහා අයදුම් කළ හැකි වන්නේ, ස්වේච්ඡාවෙන් පිටත්වී මාස 12 ක් ඇතුළතදී පමණක් වන බව සිහි තබා ගන්න.

- **එක් ගමන් වාරයක් සඳහා ලබා දෙන C-3 වීසා බලපත්‍රයකින් කොරියාවට නැවත ඇතුළුවීමෙන් පසු ඔබ කළ යුත්තේ කුමක්ද?**

කොරියාවට ගොස් දින 14ක් ඇතුළතදී "www.hikorea.go.kr" යන වෙබ් අඩවියට පිවිස ඔබගේ කොරියානු ලිපිනය වාර්තා කළ යුතුය.

ඔබ කොරියාව තුළ නතර වී සිටීමට අදහස් කරන්නේ දින 14 කට වඩා අඩු කාලයක් නම් ඔබ පිටත් වීමට පෙරාතුව ඔබ නවාතැන් ගෙන සිටින ස්ථානයේ ලිපිනය වාර්තා කළ යුතුය.

එසේ කිරීමෙන් කිසිදු වරදක් සිදු නොකර කොරියාවෙන් පිටත්වීම හේතු කොට ගෙන, එක් ගමන් වාරයක් සඳහා ඔබට නිකුත් කර ඇති C -3 වීසා බලපත්‍රය කල් ඉකුත් වීමට පෙරාතුව ඔබට C-3 බහු ගමන් වාර සඳහා නිකුත් කරන (උපරිම දින 90 ක් සඳහා වන අතර මාස 12 ක් දක්වා වලංගු වෙයි.) වීසා බලපත්‍රයක් අයදුම් කිරීමට අවස්ථාව ලැබෙනු ඇත.

බහු ගමන් වාර සඳහා නිකුත් කරන C-3 වීසා බලපත්‍රයක් ඇති අය පමණක් තමන් නතරව සිටින කාලය තුළදී නවාතැන වෙනස් කරන්නේ නම් ඒ බව වාර්තා කළ යුතු වනු ඇත.

- **2020 ජූනි 30 වන විට ස්වේච්ඡාවෙන් පිටත් වීමට පියවර නොගතහොත් නියම කරනු ලබන දඩ මුදල කීයද?**

***2020 ජූලි 01** දිනෙන් පසු ස්වේච්ඡාවෙන් පිටත් වීමට ඔබ තීරණය කරන්නේ නම් ඔබගේ සංක්‍රමණ වරද වෙනුවෙන් 30% ක සම්මත දඩ මුදලක් නියම කරනු ලබන අතර ඔබ 2020 ඔක්තෝබර් 01 දිනෙන් පසු පිටත් වන්නේ නම්, 50% ක සම්මත දඩ මුදලක් ඔබට නියම කෙරෙනු ඇත.*

**2. ඔබ කෘෂිකර්මාන්තයට / ධීවර කර්මාන්තයට අයත් රැකියාවක නියුතු නීති විරෝධි සංක්‍රමණිකයෙක් නම් , 2019 දෙසැම්බර් 11 සහ 2020 ජනවාරි 15 අතර දිනක ඔබගේ සේවා යෝජකයා මඟින් ස්වේච්ඡාවෙන් පිටත්වීමේ අවස්ථාවක් සඳහා අයදුම් කරන්න.**

- **ඔබ යා යුතු වන්නේ කොතැනටද?**

ඔබගේ පදිංචි ප්‍රදේශය තුළ ඇති ආගමන කාර්යාලයට ඔබගේ සේවා දායකයා සමඟ යන්න

- **ඔබ රැගෙන යා යුතු ලිපි ලේඛන මොනවාද?**

ඔබගේ ගමන් බලපත්‍රය,ස්වේච්ඡාවෙන් පිටත්වීම පිළිබඳ ප්‍රකාශය සහ බෝඩින් පාස් එක

- **පිටත්වීමට පෙර මා ලබා ගත යුතු දේ මොනවාද?**

ස්වේච්ඡාවෙන් පිටත්වීම සහතික කළ ලේඛනයක් වාර සේවකයන් සඳහා ලැබෙනු ඇත.
කරුණාකර මෙම ලේඛනය පරිස්සම් කර ගන්න.

- **ඔබට හිමිවන ප්‍රතිලාභ මොනවාද?**

දඩ මුදලෙන් නිදහස් කෙරෙනු ඇත. ඔබ අසාදු ලේඛනයට ඇතුළත් නොකෙරෙනු ඇත. අවශ්‍ය නම් පසුව ඔබට C- 4 ( කෙටි කාලීන වාර සේවක වීසා බලපත්‍රය ) හෝ E-8 (දිගු කාලීන වාර සේවක වීසා බලපත්‍රය) යන වීසා බලපත්‍ර සඳහා අයදුම් කළ හැක.

ඔබගේ අවධානය පිණිස : දඩ මුදලෙන් නිදහස් කිරීමද ඔබගේ සේවා දායකයාට අදාළ වනු ඇත.

**3 ඔබ සුළු පරිමාණ කර්මාන්ත අංශයේ නිෂ්පාදන ක්ෂේත්‍රයේ රැකියාවක නියුතු නීති විරෝධි සංක්‍රමණිකයෙක් නම් , 2019 දෙසැම්බර් 11 සහ 2020 මාර්තු 31 අතර දිනක ඔබගේ සේවා යෝජකයා මගින් ස්වේච්ඡා පිටත්වීමේ අවස්ථාවක් සඳහා අයදුම් කරන්න.**

- **ඔබ යා යුතු වන්නේ කොතැනටද?**

ඔබ සේවය කරන ප්‍රදේශය තුළ ඇති ආගමන කාර්යාලයකට යන්න

- **ඔබ රැගෙන යා යුතු ලිපි ලේඛන මොනවාද?**

ඔබගේ ගමන් බලපත්‍රය,ස්වේච්ඡාවෙන් පිටත්වීම පිළිබඳ ප්‍රකාශය සහ පිටත්වීම කල් දැමීමට අදාළව සම්පූර්ණ කරන ලද අයදුම්පතක්

- **ඔබට හිමිවන ප්‍රතිලාභ මොනවාද?**

ස්වේච්ඡාවෙන් පිටත්වීමේ අවස්ථාවක් සඳහා අයදුම් කළ දින සිට මාස තුනක කාලයක් සේවයේ නිරතව සිටීමට අවස්ථාව ලැබෙනු ඇත.

- **කොරියාවට නැවත ඇතුළුවීම සඳහා අයදුම් කළ හැකි වීසා බලපත්‍ර වර්ග කවරේද?**

ඔබ කොරියානු ජන වර්ගයට අයත් විදේශයක සිටින අයෙක් නම්, C-3-8, H-2 හෝ F -4 වීසා බලපත්‍ර සඳහා අයදුම් කළ හැකිය.

**එසේ නොවන්නේ නම්, ඔබට E-9, D-2, D-4, හා D-8 යන වීසා බලපත්‍ර සඳහා අයදුම් කළ හැකිය.**

4 **ඔබ E-9 හෝ H-2 වීසා බලපත්‍ර සහිතව නීති විරෝධි ලෙස රැකියාවක නියුතුව සිටින අයෙක් නම් , 2019 දෙසැම්බර් 11 සහ 2020 මාර්තු 31 අතර දිනක ඔබගේ සේවා යෝජකයා මගින් ස්වේච්ඡා පිටත්වීමේ අවස්ථාවක් සඳහා අයදුම් කරන්න.**

ඔබ EPA වැඩසටහන යටතේ රැකියාවක නියුතු අයෙක් නම් , පළමු වසර 3 ඇතුළත (සේවා දිගු රහිතව) හෝ වසර 4 යි මාස 10 ක් ඇතුළත (ඔබට සේවා දිගු ලබා දී ඇත්නම්) අනිවාර්ය වාර්තා අයිතම ප්‍රකාශ කිරීමට අපොහොසත් වූ අයෙක් නම් (උදා: වරින් වර රැකියා මාරු කරන විට) ස්වේච්ඡා පිටත්වීමේ අවස්ථාවක් සඳහා අයදුම් කිරීමට ඔබ සුදුසුකම් ලබනු ඇත.

- **ඔබට හිමිවන ප්‍රතිලාභ මොනවාද?**

E-9 වීසා බලපත්‍ර හිමි අයට දඩ මුදලෙන් 70% ක් අඩු වනු ඇත.

සම්මත දඩ මුදලෙන් 30% ක් පමණක් ඔවුන්ගෙන් අය කෙරෙනු ඇත. රැකියාව ආරම්භයේදී ඉහත ප්‍රකාශය ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම වෙනුවෙන් H-2 වීසා බලපත්‍ර හිමි අය සඳහා අධිකරණ අමාත්‍යාංශය විසින් දඩ මුදලක් පනවනු ඇත.

එහෙත් ඔවුන්ගේ වත්මන් සේවා ස්ථානය තුළ රැකියාව කරගෙන යාමට ඔවුන්ට අවසර ලැබෙනු ඇත. එමෙන්ම රැකියා ශ්‍රමිකයන් පිළිබඳ අමාත්‍යාංශය මඟින් ඔවුන්ගේ රැකියාව මාරු කිරීමට සහාය ලැබෙනු ඇත.

➢ **ඔබ රැගෙන යා යුතු ලිපි ලේඛන මොනවාද?**

ඔබගේ ගමන් බලපත්‍රය, විදේශිකයන් ලියාපදිංචි කිරීමේ කාඩ්පත.ඔබ ඔබගේ සේවා යෝජකයා සමඟ පැමිණීම අත්‍යවශ්‍ය බව කාරුණිකව දන්වා සිටිමු.

- 2020 පෙබරවාරි 01 දිනෙන් පසු නීති විරෝධී ලෙස සිටින විදේශිය පදිංචිකරුවන් හා නීති විරෝධී ලෙස ශ්‍රමිකයන් ලබා ගන්නා සේවා යෝජකයන් සිටින බවට හඳුනා ගතහොත් 2020 අප්‍රේල් 01 දිනෙන් පසු ඔවුන්ට කිසිදු අනුකම්පාවකින් තොරව සම්පූර්ණ දඩ මුදලම නියම කෙරෙනු ඇත.

- 2020 මාර්තු 01 දිනෙන් පසු අපගේ නිලධාරීන් විසින් නීති විරෝධි පදිංචිකරුවන් සිටින බවට අනාවරණය කර ගතහොත් සම්පූර්ණ දඩ මුදල ඔවුන්ගෙන් අය කෙරෙනු ඇත. එය ගෙවීමට අපොහොසත් වුවහොත් ඔවුන්ගේ නම් අසාදු ලේඛනයට ඇතුළත් කෙරෙනු ඇත.

**වැඩිදුර තොරතුරු සඳහා 1345 අමතා ආගමන ඇමතුම් මධ්‍යස්ථානය වෙත යොමු වන්න.**